# ශ්‍රී ලංකාවේ තරුණ විරැකියාව



සැකසුම : කේ.යූ . අයි විජේවර්ධන

සංවර්ධන නිලධාරී

මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව

තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය

# ශ්‍රී ලංකාවේ තරුණ විරැකියාව

තරුණ විරැකියාව යනු වයස අවුරුදු 15 ත් 24 ත් අතර රැකියා විරහිත ජනගහනය වේ. තරුණ විරැකියා අනුපාතය 2019 වර්ෂයේ 21.5% කි. මෙහි දී සිදු වනුයේ තරුණ තරුණියින් වෘත්තියක් හදාරන නමුත් රැකියාවක් සොයා ගැනීමට අරගල කිරීමයි. සංවර්ධනය වෙමින් පවතින රටක් ලෙස ශ්‍රී ලංකාවේ තරුණ තරුණියන්ගේ විරැකියාව සමාජයේ සහ ආර්ථිකයේ යහපැවැත්මට හානිදායක බලපෑමක් වේ.

2014 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා ශ්‍රී ලංකාවේ තරුණ විරැකියා අනුපාතය පහත පරිදිවේ.




ප්‍රස්තාර : 01

මූලාශ්‍රය : ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකාවේ ශ්‍රම බල සමීක්ෂණ වාර්තාව - 2019

ඉහත ප්‍රස්තාරයට අනුව ශ්‍රී ලංකාවේ තරුණ විරැකියා අනුපාතය 2017 වර්ෂයේ දී සැලකියයුතු ප්‍රමාණයක් අඩු වී ඇති අතර නැවත 2018 සහ 2019 වර්ෂයන් හි ඉහළ නැගීමක් දක්නට ලැබේ.

ශ්‍රී ලංකාවේ දැවෙන ප්‍රශ්න අතර තරුණ විරැකියාව පිළිබඳ ගැටලුව ප්‍රමුඛ ස්ථානයක් ගනී. විරැකියාව අවම කර එලදායී මෙන් ම තෘප්තිමත් සේවා නියුක්තියක් ඇති කරලීම සිදු කළ යුතුය. තරුණ ශ්‍රමය රටේ නිෂ්පාදන ක්‍රියාවලියට බද්ධ කර ගත යුතුය. සේවා වියුක්තියට අදාළ තරුණ පරම්පරාව ශීඝ්‍රයෙන් ඉහළ යාම ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික කටයුතු වලට විශාල ලෙස බලපානු ඇත. ශ්‍රී ලංකාවේ සේවා වියුක්තිය පිළිබඳ අවධානය යොමු කිරීමේ දී උගත් තරුණ පිරිස අතර වැඩිපුර සේවා වියුක්තියක් දක්නට ලැබේ.

රටේ සංවර්ධන සැලසුම් ක්‍රියාත්මක කිරීම සඳහා තරුණ තරුණියින් ආකර්ෂණය කර ගැනිම සඳහා අවශ්‍ය රැකියා උත්පාදනය, ආරක්ෂාව, මානව හිමිකම් සහ යුක්තිය සහතික කෙරෙන පරිසරයක් නිර්මාණය කිරීම වැදගත් වේ.

### ශ්‍රී ලංකාවේ පළාත් අනුව තරුණ විරැකියා අනුපාතය (ප්‍රතිශත ලෙස)

| පළාත | වර්ෂය | | | | | |
|---|---|---|---|---|---|---|
| | 2014 | 2015 | 2016 | 2017 | 2018 | 2019 |
| බස්නාහිර | 14.3 | 15.9 | 14.7 | 13.7 | 12.9 | 15.0 |
| මධ්‍යම | 23.9 | 25.5 | 26.0 | 24.5 | 31.3 | 28.2 |
| දකුණ | 28.4 | 27.9 | 30.3 | 25.7 | 29.3 | 31.5 |
| උතුර | 19.1 | 18.8 | 24.7 | 26.6 | 19.8 | 17.4 |
| නැගෙනහිර | 16.4 | 21.7 | 20.1 | 16.1 | 22.6 | 21.3 |
| උතුරු නැගෙනහිර | 21.3 | 15.2 | 16.0 | 15.2 | 19.7 | 19.9 |
| උතුරු මැද | 13.6 | 16.3 | 19.7 | 17.3 | 24.5 | 19.4 |
| ඌව | 21.1 | 22.0 | 24.8 | 20.3 | 28.0 | 23.8 |
| සබරගමුව | 30.9 | 29.6 | 30.0 | 18.3 | 21.1 | 25.2 |

වගු : 01

මූලාශ්‍රය : ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකාවේ ශ්‍රම බල සමීක්ෂණ වාර්තාව

පළාත් අනුව තරුණ විරැකියාව වැඩිම දකුණු පළාතේ වන අතර එය 31.5 % වේ. බස්නාහිර පළාතේ විරැකියාව අවම මට්ටමක පවතී. මධ්‍යම, සබරගමුව, ඌව හා නැගෙනහිර පළාත් වල සැලකිය යුතු විරැකියා අනුපාතයක් දක්නට ලැබේ. සමස්තයක් ලෙස පළාත් නවයෙහි ම රැකියා වියුක්තිය ඉහළ අනුපාතයක් ගනී. මෙය රටක ආර්ථික වර්ධනයට විශාල බලපෑමක් වේ.

### ස්ත්‍රී පුරුෂ භාවය අනුව තරුණ විරැකියා අනුපාතය




ප්‍රස්තාර : 02

මූලාශ්‍රය : ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකාවේ ශ්‍රම බල සමීක්ෂණ වාර්තාව - 2019

ශ්‍රී ලංකාවේ තරුණ විරැකියා අභියෝගය ස්ත්‍රී පුරුෂ අනුව බෙදී පවතින අතර එහි දී කාන්තා තරුණ විරැකියාව පුරුෂ තරුණ විරැකියාවට වඩා වැඩි වේ. තරුණ පරම්පරාව සමාජයේ වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. 60 හා 70 දශක වල පරම්පරාවට සාපේක්ෂව වර්තමාන පරපුරේ ගති ලක්ෂණ, අධ්‍යාපනය හා

සංස්කෘතිය බෙහෙවින් වෙනස් වී ඇත. ශ්‍රී ලංකාවේ තරුණ පරම්පරාවට බලපාන ප්‍රබල ප්‍රශ්නයක් වන්නේ විරැකියා අනුපාතය ඉහළ යෑමයි.

**අධ්‍යාපන මට්ටම අනුව තරුණ විරැකියාව (ප්‍රතිශත ලෙස)**

| අධ්‍යාපන මට්ටම | 2014 | 2015 | 2016 | 2017 | 2018 | 2019 |
|---|---|---|---|---|---|---|
| 5 ශ්‍රේණිය සහ ඉන් පහළ | 10.4 | 4.8 | 6.5 | 7.8 | 8.8 | 12.8 |
| 6 ශ්‍රේණියේ සිට අ.පො.ස (සා.පෙ.) තෙක් | 14.8 | 14.1 | 16.3 | 11.8 | 16.3 | 15.7 |
| අ.පො.ස (සා.පෙ.) සමත් | 22.8 | 23.9 | 22.4 | 21.1 | 20.2 | 22.5 |
| අ.පො.ස (උ.පෙ) හා ඉන් ඉහළ සමත් | 31.3 | 34.0 | 32.5 | 29.1 | 32.6 | 30.7 |

වගු: 02

මූලාශ්‍රය : ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකාවේ ශ්‍රම බල සමීක්ෂණ වාර්තාව - 2019

තරුණ විරැකියාවෙන් පසුවන්නන් අතර අ.පො.ස (උ.පෙ) හා ඉන් ඉහළ අධ්‍යාපනයක් ලද පිරිස වැඩි අගයක් ගනී. උසස් අධ්‍යාපනය අවසන් කිරීමෙන් පසු ශ්‍රම බලකායට ඇතුළු වන නව තරුණ කණ්ඩායම් ඉහළ විරැකියා අනුපාතයක් පෙන්නුම් කරයි.

ශ්‍රී ලංකාවේ තරුණ විරැකියාව ප්‍රධාන ගැටලුවක් වන අතර එහි කැපී පෙනෙන ලක්ෂණයක් වන්නේ මෙම තරුණ කොටසින් බොහෝ ප්‍රමාණයක් උගත් පුරවැසියන් වීමයි. බොහෝ සුදුසුකම්ලත් තරුණ තරුණියන්ට තාක්ෂණික කුසලතා හෝ රැකියාවක් සඳහා සුදුසු අධ්‍යාපන සුදුසුකම් ඇති නමුත් දැනුම වෘත්තියක් බවට පරිවර්තනය කිරීමේ මෘදු කුසලතා නොමැති බව පැහැදිලිය.

වසරින් වසර අධ්‍යාපන ජයග්‍රහණ ඉහළ යමින් තිබුණ ද රැකියා වෙළඳපොළේ ජයග්‍රහණය ලබා ගැනීමට ශ්‍රී ලාංකික තරුණ තරුණියන්ට අභියෝගයක් වී ඇත. අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ සංඛ්‍යාලේඛන වලට අනුව දළ වශයෙන් අ.පො.ස උසස් පෙළ විභාගයට පෙනී සිටින සිසුන් 267,000 ගෙන් ආසන්න වශයෙන් විශ්වවිද්‍යාල වරම් ලබන්නේ 35,000 ක් පමණි. අනෙක් පිරිසගෙන් බොහෝමයක් විවිධ වෘත්තීය පුහුණු ආයතන වලට ඇතුළත් වේ. එමෙන් ම අ.පො.ස සාමාන්‍ය පෙළ විභාගයෙන් පසුව ද ශ්‍රම වෙළඳපොළට ඇතුළු වීමට කොටසක් බලා හිඳී. රටේ විශාලතම සමාජ ආර්ථික අභියෝගය වන්නේ වාර්ෂිකව ශ්‍රම වෙළඳපොළට ඇතුළු වන මෙම පිරිසට සුදුසු රැකියාවක් සොයා ගැනීමයි.

මේ වන විට ශ්‍රී ලංකාවේ තරුණ විරැකියා අනුපාතය 21.5 % දක්වා ඉහළ ගොස් ඇති අතර 2020 වර්ෂයේ ඇති වූ කොරෝනා වසංගත තත්වය මෙය තවත් ඉහළ යෑමට බලපානු ඇත.

තරුණ විරැකියාව පිළිබඳ කතා කිරීමේ දී ග්‍රාමීය තරුණ විරැකියාව කෙරෙහි අවධානය යොමු කළ යුතුය. රැකියා විරහිත තරුණ තරුණියන් බොහෝ ප්‍රමාණයක් ග්‍රාමීය ප්‍රදේශ වල ජීවත් වේ. මෙම පිරිස මූලික වශයෙන් අධ්‍යාපනය ලබන්නේ ද්විතික පාසල් මට්ටම දක්වා හෝ ඊටත් වඩා අඩු මට්ටමකය. බොහෝ විට මෙම කණ්ඩායම් වල බහුතරයක් නාගරික ප්‍රදේශ වල රැකියා සඳහා යොමු වීමට අකමැතිය. එයට හේතුව වන්නේ බොහෝ දෙනෙකුට හැකියාව තිබෙන්නේ සිංහල භාෂාව කතා කිරීමට පමණි. එමෙන් ම

නාගරික ජීවිතයට හැඩ ගැසීමට ඔවුන්ට අපහසුය. එබැවින් ග්‍රාමීය තරුණ තරුණියින් සඳහා නගර වල රැකියා ලබා දුන්න ද ඔවුන් එය අතහැර දමා කෙටි කාලයක් තුළ නැවත ගම් වලට පැමිණීම සිදු වනු ඇත. ග්‍රාමීය මට්ටමින් රැකියා නිර්මාණය කිරීම හෝ ස්වයං රැකියා වලට යොමු කිරීම මෙහි දී වඩා යෝග්‍ය වනු ඇත.

නාගරික තරුණ තරුණියින් බොහෝ දෙනෙක් ශ්‍රම වෙළඳපොළේ පවතින රැකියා පිළිබඳ අවබෝධයක් ඇති අතර ඒ සඳහා ඔවුන් පුහුණු කළ යුතුය. මෙම පිරිසගේ ආකල්පමය වෙනසක් ඇති කළ යුතුය. ඔවුන් බොහෝ දෙනෙක් විශාල වැටුපක් බලාපොරොත්තු වීම ද දක්නට ලැබේ. සැලසුම් සහගත වැඩිදියුණු කරන ලද වෘත්තීය පුහුණු වැඩසටහන් සකස් කිරීම මඟින් මෙම ගැටලුව තරමක් දුරට අවම කර ගත හැකිය.

රැකියාවක් සොයමින් ශ්‍රම වෙළඳපොළ තුළ සිටින තරුණ තරුණියින් හොඳ රැකියාවක් සඳහා පෝලිම් ගැසී සිටිති. තමන් බලාපොරොත්තු වන රැකියාවම ලැබෙන තෙක් ඔවුන් සිටින අතර දෙමාපියන් ද ඒ සඳහා දිරිමත් කරනු ලැබේ. අඩු සුදුසුකම් ඇති අය රැකියා ලෝකයේ රැකියා අවස්ථා ලබා ගන්නා අතර එයින් ලබන අත්දැකීම් මත ඔවුන් පරිපූර්ණත්වයට පත් වනු ලැබේ.

බටහිර ලෝකයේ මෙන් නොව ශ්‍රී ලංකාවේ රැකියා විරහිත තරුණ පිරිසගේ මූලික අවශ්‍යතා සඳහා දෙමාපියන්ගේ මූල්‍යමය සහය ලැබෙන් ඇත. ප්‍රාථමික වයසේ ජීවිතය ගත කරන මෙම පිරිස තුළ ඉදිරිය පිළිබඳ ඉලක්කයක් නොමැති වන අතර අනවශ්‍ය වූ ක්‍රියාකාරකම් කෙරෙහි යොමු විය හැකිය. එය සමාජයට තර්ජනයක් විය හැකිය.

**තරුණ විරැකියාව අවම කිරීම සඳහා විසඳුම් හා යෝජනා**

- රටේ පවතින ප්‍රධාන ගැටලුවක් වන තරුණ විරැකියාව අවම කිරීම සඳහා ප්‍රතිපත්ති සකස් කළ යුතුය. විවධ ක්ෂේත්‍ර වලින් දක්ෂතා හා දැනුමින් පරිපූර්ණ තරුණ පිරිසක් බිහි කළ යුතුය.
- තරුණ තරුණියින් වෘත්තීය පුහුණු ආයතන වලට යොමු කර වෘත්තීය පුහුණු ලබා දී රැකියා වෙත යොමු කිරීම.
- සුදුසුකම් වලට ගැළපෙන රැකියා නිර්මාණය කිරීම.
- පෞද්ගලික අංශය ශක්තිමත් කිරීම හා තරුණ තරුණියින් ව්‍යවසායකයින් බවට පත් කිරීම තුළින් වැඩි රැකියා ප්‍රමාණයක් උත්පාදනය කර තරුණ විරැකියාව අවම කර ගත හැකිය.

**මූලාශ්‍ර**


- ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකාවේ ශ්‍රම බල සමීක්ෂණ වාර්තාව - 2019